# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1559/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 09/10/2024 පැය 0940

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරිම.</u>**

**01. 2024.10.08 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 05 | 05 | 1250 | 1250 | තඹ දඟර 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර**

2024.10.08 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මුල්ලේරියාව පොලිස් වසමේ මුල්ලේරියාව රෝහල මාර්ගය ආසන්න ප්‍රදේශයේ වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 61 මිලි ග්‍රෑම් 400 ක් හා ජංගම දුරකථනයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මුල්ලේරියාව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**
මුල්ලේරියාව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03.** **බලපත්‍ර ප්‍රවාහන කොන්දේසි උල්ලංඝණය කරමින් වැලි ප්‍රවාහනය කල සැකකරුවන් 12 දෙනෙකු ටිපර් රථ 12ක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ලාහුගල කඳවුර**

2024.10.08 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ලාහුගල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පොතුවිල් පොලිස් වසමේ හැඩඔය යාය මාර්ගය ආසන්න ප්‍රදේශයේදී සිදු කරන ලද වැටලීම් 12කදී බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් වැලි ප්‍රවාහනය කළ සැකකරුවන් 12 දෙනෙකු වැලි ප්‍රවාහනය සඳහා යොදාගත් ටිපර් රථ 12 ක් සමඟ අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 27ත් 46ත් අතර වයස් වල පසුවන හක්මණ, තංගල්ල, ලුණුගම්වෙහෙර, වීරකැටිය, වලස්මුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**